ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය
23 JUL 2019
පුස්තකාලය

# ශ්‍රී ලාංකේය ථේරවාද බුදුදහම හා තදනුබද්ධ සංස්කෘතිය කෙරෙහි මහායාන බුදුදහමෙන් ලැබුණු ආභාසය

- කිරම විමලතිස්ස හිමි

බුදුරදුන් විසින් පන්සාලිස් වසක් දේශනා කරන ලද ධර්මය ශාසනය තුළම බිහි වූ විවිධ මතධාරීන්ගෙන් ආරක්ෂා කර ගෙන විධිමත් සැලැස්මක් මත කරන ලද ධර්ම සංරක්ෂණයක් පළමු ධර්ම සංගායනාවේ දී දැකගත හැකිය. කාලානුරූපීව මතු වූ සංශෝධනයන් ප්‍රතික්ෂේප කරමින් නිර්මල බුදුදහමේ අඛණ්ඩ පැවැත්ම අපේක්ෂා කළ පිරිස් විසින් ද්විතීය සංගායනාව සිදුකරන ලදි. එහෙත් තව දුරටත් ඒකීය මතධාරීන් නොවී සිටි පිරිස් විසින් ස්වකීය මතවාදයන් ඔස්සේ ධර්මය විග්‍රහ කිරීම නිසා තෘතීය ධර්ම සංගායනාව වන විට ශාසනය විවිධ නිකායන්ට බෙදී ගිය අයුරු දැකගත හැකිය.[1] කෙසේ වූවද මුල් බුදුදහමේ අනන්‍යතාව ආරක්‍ෂා කරගත් පිරිස වශයෙන් සැලකෙන ථෙරවාද සම්ප්‍රදාය තව දුරටත් ස්වකීය ආධිපත්‍ය පවත්වාගත් අතර වංශකථාවල සඳහන්වන ආකාරයට අශෝක අධිරාජ්‍යාගේ අනුග්‍රහය ඇතිව ථෙරවාද මතය පිළිනොගන්නා භික්‍ෂූන් ශාසනයෙන් නෙරපීමටත් ධර්ම සංගායනාවක් පවත්වා ථෙරීය මතය තවදුරටත් ස්ථාවර කිරීමටත් කටයුතු කළේය. තවද අශෝක අධිරාජ්‍යයාගේ සහයෝගය ද ඇතිව ථෙරවාද බුදුදහම තදාසන්න රාජ්‍යවලට ද හඳුන්වා දුන් අතර එකී ධර්මප්‍රචාරයේ ප්‍රතිඵලයක් ලෙස මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත පිරිස ලක්දිවට බුදුසමය රැගෙන ආහ.[2]

බුදුදහම ලක්දිවට පැමිණෙන විට සංවිධානාත්මක ආගමක් මෙරට නොපැවති බැවින් නොබෝ කලකින්ම එය රාජ්‍ය ආගම බවට පත් විය. ථෙරවාදයට එරෙහි වෙනත්

නිකායයන් නොපැමිණීම මෙන්ම වෙනමම රාජ්‍යයක් වශයෙන් භාරතය ඇතුළු සෙසු රටවලට දුරින් පිහිටි බැවින් ද ථෙරවාද බුදුදහම මෙහි තදින් මුල් බැසගත්තේය. එම නිසා කලක දී ලක්දිව සලකන ලද්දේ පිරිසිදු ථෙරවාද නැමැති දියරැඳි උල්පතක් වශයෙනි.

### මහායාන

පළමු සංගායනාව පැවැති වකවානුවේ සිටම ශාසනය තුළ විවිධ මතධාරී පිරිස් සිටි බව ශාසන ඉතිහාසයෙන් පැහැදිලි වන්නකි. ද්විතීය ධර්මසංගායනාවෙන් පසු පළමුවරට **ස්ථවිරවාද** (පාලි - ථෙරවාද) හා **මහාසාංඝික** යනුවෙන් වෙන් වූ සම්ප්‍රදායයන් දෙකක් බුදුසසුන තුළ පහළ වන අතර එම සම්ප්‍රදායයන් තවදුරටත් විභේදනය වීමෙන් තෙවන සංගායනාව වන විට දහඅටක් දක්වා විවිධ නිකායන්ට බෙදී ගිය බව ප්‍රකටය. මහායාන සම්ප්‍රදායේ ආරම්භයට මෙසේ ථෙරවාදයෙන් වෙන්ව ගිය සෙසු සම්ප්‍රදායයන්ගේ අදහස් බලපා ඇති බව දැකගත හැකිය. එහෙත් මෙම මහායාන සම්ප්‍රදාය කවරදා කොතැනක දී ආරම්භ වූයේ දැයි නිශ්චිතවම කිව නොහැකිය. එහෙත් කණිෂ්ක රජ දවස (ක්‍රි.ව. 1 සියවස) පැවති සිව්වැනි ධර්ම සංගායනාවෙන් පසුව මෙය ආරම්භ වූ බවට සැලකේ. ක්‍රි. ව. දෙවැනි සියවසේ පමණ සිටි බව සැලකෙන නාගර්ජුන නම් ආචාර්යවරයා විසින් මෙය විධිමත් ලෙස දියුණු කරන ලදි. ඥානමාර්ගයට වඩා භක්තිමාර්ගයට ප්‍රමුඛස්ථාන ලබාදුන් මහායානිකයෝ බුදුරදුන්ගේ අධිමානුෂීයභාවය ඉස්මතුකොට දැක්වූහ. බුදුරදුන්ට ධර්මකාය, සම්භෝගකාය හා නිර්මාණකාය යනුවෙන් ත්‍රිවිධ කායක් ඇති බවත් එයින් ධර්මකාය සදාකාලික බවත් ඔවුන්ගේ ඉගැන්වීමයි. සැම කෙනෙක්ම බෝධිසත්වවරයෙක් වශයෙන් සලකන මොවුහු බුද්ධත්වයෙන්ම නිර්වාණය පසක් කළ යුතු බව දක්වන නිසා මහායාන වශයෙන් හඳුන්වති. රහත් භාවයෙන් හෝ නිර්වාණාධිගමය ලැබීම උසස් කොට සලකන ථෙරවාදීන් මොවුන් හැඳිවූයේ ''හීනයානිකයන්" වශයෙනි.[3]



### ලක්දිවට මහායාන අදහස් පැමිණීම පිළිබඳ මතවාද

ලක්දිවට ථෙරවාද බුදුදහම පැමිණීමෙන් පසුව එහි කේන්ද්‍රස්ථානය වූයේ අනුරාධපුරයේ පිහිටි මහාවිහාරය බව ප්‍රකටය. අධ්‍යාත්ම සංර්ධනයට මුල් තැනක් දෙමින් ධර්ම විනය පෝෂණය සඳහා මහාවිහාරයෙන් සිදු වූ කාර්යභාරය සුවිශාලය. ධර්ම විනයානුගතව සමගි සම්පන්නව මෙහි වැඩසිටි භික්ෂූන් වහන්සේලා අතර මතභේදයක් උත්පන්න වන්නේ වලගම්බා රජු විසින් පෞද්ගලිකව කරන ලද ආරාම පූජාවක් නිසාය. විදේශ ආක්‍රමණ නිසා පළමුවර පලායන වළගම්බා රජහට උදව් කළ මහාතිස්ස නම් මහතෙරුන්ට දෙවන වර රජ පැමිණි වළගම්බා රජු අභයගිරි නම් ආරාමය තනා පෞද්ගලික පූජාවක් ලෙස පූජා කළේය. මෙකී හේතුව නිසා මෙතෙක් අභේදයිතව පැවැති ලක්දිව ථෙරවාද සඟ පරපුර දෙදරා ගිය අතර මහාවිහාර භික්ෂූහු මෙම පෞද්ගලික ආරාම පූජාව පිළිගත් තිස්ස තෙරුන්ට " කුලසංසට්ඨ" චෝදනාවෙන් චෝදනා කොට "පබ්බාජනීය කර්මය" ද කළහ. ඉන් පසු කිපුණු මහදැළියා තිස්ස නම් මහාවිහාරයේම වාසය කළ මහාතිස්ස තෙරුන්ගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් එසේ නොකරන ලෙස කළ ඉල්ලීම නිසා "මෙහු ද අශුද්ධානුවර්තකයැයි'' චෝදනා කොට ඔහුට ''උක්ඛෙපනීය කර්මය'' කළහ. ඉන්පසු එම තෙරුන්ද පන්සියයක් භික්ෂූන් රැගෙන අභය ගියට ගොස් පදිංචි වූ බව සඳහන් වේ.[4] මේ අතර දඹදිව වජ්ජිපුත්‍ර නම් බෞද්ධ සම්ප්‍රදායට අයත් ධර්මරුචි නම් ආචාර්යවරයාගේ ශිෂ්‍ය පිරිසක් පැමිණ අභයගිරි නිකායිකයින් සමග සම්බන්ධ වූහ. මොවුන් ථේරීය සම්ප්‍රදායෙන් බිඳීගිය පිරිසක් වේ. එමෙන්ම ථෙරවාදීන්ගේ අනාත්මවාදී ඉගැන්වීම මොවුන් විසින් ප්‍රතික්ෂේප කරන අතර රහතන් වහන්සේ රහත්බවින් පිරිහීයාහැකි බව ද දක්වා ඇත[5]. පසුකාලීනව බිහි වූ මහායාන සම්ප්‍රදායේ ඉගැන්වීම්වලට මෙම අදහස් බලපා ඇතැයි කිව හැකිය. කෙසේ වූවද එම මතය පිළිගත් අභයගිරිකයෝ අභයගිරි නාමය ද අතහැර ධර්මරුචි නිකාය නමින් පෙනී සිටියහ. මෙය බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 454 ක් ඉක්ම ගිය පසු සිදු වූ බව නිකාය සංග්‍රහයේ දැක්වේ.

අනතුරුව වෝහාරිකතිස්ස රජ දවස (ක්‍රි.ව.265-685) වෛතුල්‍යවාදය නමින් නව මතවාදයක් ව්‍යාප්ත වූ අතර අභයගිරිවාසීන් එය බුද්ධ භාෂිත බව පිළිගත්ත ද මහාවිහාරිකයන් එය ධර්ම විනය සමග නොගැළපේ යැයි තීරණය කර බැහැරකර තිබේ.[6] රජු කපිල නම් ධර්මය පිළිබඳ අවබෝධයක් ඇති අමාත්‍යවරයා ලවා මෙය පරීක්ෂා කරවා අධර්මවාදී යැයි බැහැර කර තිබේ.[7] මෙම වෛතුල්‍යාවාදය පිළබඳ විවිධ මත පවතී. ඇතමෙක් මෙය මහායාන ඉගැන්වීමක් බව පිළිගත්ත ද සමහරෙක් එය ප්‍රතික්ෂේප කරති. වංශකථා තුළ ද මේ පිළිබඳ වැඩි විස්තරයක් සඳහන් නොවේ. එහෙත් වෛපුල්‍ය සූත්‍ර යනු මහායාන සූත්‍ර වලට ව්‍යවහාර වූ නමක් බවත් සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ කැෂ්ගාර්හි තිබී හමු වූ අත් පිටපතේ මේ නම ලියා ඇත්තේ වෛතුල්‍ය සූත්‍ර යනුවෙන් බවද එම නිසා ලංකාවේ වෛතුල්‍යවාදීන් මහායානිකයන්ම බව මහාචාර්ය කර්න් පවසයි.[8] අසංග තෙරුන් ද සිය අභිධර්මසමුච්චයේ දී වෛපුල්‍ය, වෛතුල්‍ය හා වෛදල්‍ය යන පද තුනම සමාන අර්ථයෙන් යොදා තිබීමෙන් බොහෝවිට මෙය මහායාන ධර්මය ඇතුළත් වෛපුල්‍ය සූත්‍ර විය හැකි බව සිතිය හැක. එහි අර්ථය බෝධිසත්ව පිටක යන්නය.[9]

වෛතුල්‍යවාදය මෙහි දී යටපත් වූවත් ඊට හතලිස් වසරකට පසුව ගෝඨාභය රජ දවස නැවතත් හිස එසවීය. එවරද මහා විහාරිකයන් විසින් එය ධර්ම විරෝධී බව රජුට පැවසීමත් පසුව රජු එම පොත් ගිනි බත් කොට එයට සම්බන්ධ භික්ෂූන් වන්සේලා හැට දෙනෙක් වෙර ලකුණ තබා රටින් පිටුවහල් කළේය. මෙම අර්බුද සමයේ මධ්‍යස්ථව ක්‍රියා කළ උස්සිලියා තිස්ස නම් ආචාර්යවරයෙක් තුන්සියයක් භික්ෂූන් ද රැගෙන දක්ෂිණ ගිරි විහාරයට ගොස් එහි පදිංචි වූ අතර පසුව ඔවුහු සාගල නම් තෙරුන්ගේ නමින් සාගලික නමින් හඳුන්වන්නට වූහ. මොවුන් මහසෙන් රජ දවස එතුමා ඉදිකළ දෙනානකයෙහි (ජේතවනාරාමය) ව්‍යාප්ත විය. ක්‍රි. ව. 617 රජ පැමිණි අඹහෙරණ සලමෙවන් රජ දවස සාගලිකයන් ද වෛතුල්‍ය වාදීන් වූ බව සඳහන් වේ.[10]



ගෝඨාභය රජු විසින් වෛතුල්‍ය මතදැරූ භික්ෂූන්ට කරන ලද නිග්‍රහය නිසා කිපුණු සංඝමිත්ත නම් මන්ත්‍රගුරුකම් පිළිබඳ දැනුමක් ඇති මහායාන සම්ප්‍රදායට අයත් භික්ෂුවක් සොලී රටේ සිට පැමිණ මහා විහාරික භික්ෂූන්ගෙන් පළිගැනීම සඳහා ගෝඨාභය රජ පහදවාගෙන රජුගේ ජෙට්ඨතිස්ස හා මහාසේන යන කුමාරවරුන් දෙදෙනාට අධ්‍යාපනය ලබාදීමට භාරගත්තේය. වැඩිමහල් කුමරු වූ ජෙට්ඨතිස්ස තම මතයට හරවා ගැනීමට නොහැකි වූ බැවින් බාල මහාසේන තම මතයට නම්වා ගැනීමට ඔහු සමත්විය. ජෙට්ඨතිස්සගේ රාජ්‍ය කාලයේ නැවත ඉන්දියාවට ගිය සංඝමිත්ත මහසෙන් රජ වූ පසු නැවත පැමිණ තමාගේ අභිප්‍රාය වූ මහාවිහාරය පෙළීමේ කටයුතු ආරම්භ කළේය. ඒ බව නිකාය සංග්‍රහයේ සඳහන් වන්නේ මෙසේය.

"බුදුන් පිරිනිවි අටසිය අටළොස් වන හවුරුදු සිරිලක රජ පැමිණි තමා ශිෂ්‍ය වූ මහසෙන් රජකරා එළඹ, නොයෙක් ලෙස කාරණා කියා සිතට ගන්වා "මහවෙහෙර වැසි මහණක් හට අහරක් දුන් කෙනෙක් ඇත්නම් සියක් දඩය'යි රජුගේ විධානයෙන් නුවර බෙර ලැවීය. එකල මහාවිහාර වාසීහු නුවර බැස තුන්දවසක් සිඟා ආහාර නොලදින් මහාපාය රැස්ව අපි ඉදින් සයින් වී නමුත් අධර්මය ධර්මයයි ගතුමෝ නම් බොහෝ දෙන එම ගෙන අපාය ගත වෙති,.. ජීවිතය අන්තරාය වේ නමුදූ වෛතුල්‍යවාදය නො ගනුම්හයි කථාකොට මහා විහාරය, මිරිසවැටි විහාරය, සෑගිරිය ඇතුළු වූ හාත්පස හැම විහාරවලම සිල්වත් භික්‍ෂූහු විහාර හැර රුහුණු ජනපදයට හා මලය රටට වැඩියාහ. එකල පාපමිත්‍ර වූ සඬසමිත්‍රයා සෝණ නම් අමාත්‍යයෙකු උපස්තම්භ කරවාගෙන රජහට කියා ලෝවාමහාපාය ඇතුළු වූ තුන්සිය සිව්සැටක් පමණ වූ පිරිවෙන් මහපා මුලිනුදුරුවා නස්වා විහාර භූමිය සාවා උඳු වපුරා පීය. එකල බගිරි වෙහෙරවැසි ධර්මරුචිහු ගොස් සෑගිරියෙහි විසූහ."[11]

මහාවංශයේද ඒ බව සඳහන් වේ. කෙසේ වූවද පසුව මේඝවර්ණ අභය නම් අමාත්‍යවරයෙකුගේ මැදිහත්වීම මත නැවත මහා විහාරය කරවා පලාගිය භික්ෂූන් නැවත ගෙන්වා

පදිංචි කළේය. වෛතුල්‍ය ග්‍රන්ථ ද විනාශ කළේය.[12] එසේ වුවද මහාසේන රජු මහාවිහාර සීමාවේම අභයගිරිකයන්ගේ උපදෙස් මත ජේතවන නම් වෙහෙරක් කරවා කොහොන් තිස්ස නම් ථෙරනමට පූජා කළේය.

මින් පසුව කලක් යනතුරු ශාසන තුළ අර්බුදයක් මතු නොවූ අතර නැවත මිත්‍යාලබ්ධියක් පිළිබඳව සඳහන් වන්නේ ක්‍රි.ව. 574 දී රජ පැමිණි සිලාකාල රජ දවස ය. මොහු කලක් ඉන්දියාවේ බුද්ධගයා විහාරයේ පැවිදිව සිට ඇත. එම කාලයේ එම විහාරය අයත්ව තිබුනේ මහායානිකයන්ටය. එම නිසා මොහුට මහායාන ඇසුර ලැබෙන්නට ඇත.[13] මොහු අනුරාධපුරයේ රජ වූ පසු පූර්ණ නම් වෙළෙන්දෙක් ධර්මධාතු නම් ග්‍රන්ථ මෙහි ගෙනාවේය. ඒ පිළිබඳව නිකාය සංග්‍රහයේ හා මහාවංශයේ යන කෘති දෙකේම සඳහන් වේ.

"බුදුන් පිරිනිවි ද්විතීය වර්ෂ සහස්‍රයෙහි අඹහෙරණ සලමෙවන් නම් රජෙක් මෙරට රජ විය. ඒ රජ හට දොළොස් වැන්නෙහි මෙරටින් කසී රට ගිය පූර්ණ නම් වෙළෙඳ පුත්‍රයෙක් වෛතුල්‍යවාද ලියූ පොතක් ලැබ "සැබෑ ධර්මයකැයි සිතා මෙරට ගෙනවුත් රජහට පඬුරු කොට දින. එකල ඒ රජ පෙර රජුන්සේ ධර්මවිභාග දක්නට අසමර්ථව අයගිරි වාසීවන් හා මන්ත්‍රණය කොට දෙනාවෙහෙර වෛතුල්‍යවාදී පොත ගෙන තබා භික්ෂූන් ඊට සත්කාර කරන සේ විධාන කළේය."[14]

මෙම ධර්මධාතු නම් ග්‍රන්ථය ගැන අදහස් දක්වන මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා මෙය මහායානිකයන් දක්වන පරිදි බුදුන්ගේ ත්‍රිකායෙන් පළමු කාය වන ධර්මකාය ගැන රචනා වූ ග්‍රන්ථයක් බව ප්‍රකාශ කර තිබේ.[15]

අනතුරුව පළමුවැනි අග්ගබෝධි රජ දවස (ක්‍රි. ව. 56-598) දඹදිව සිට මෙහි පැමිණි ජෝතිපාල නම් මහා ස්ථවිර නමක් ප්‍රසිද්ධ විවාදයකින් වෛතුල්‍යවාදීන් පරාජය කර තිබේ. මෙයින් පැහැදලි වන්නේ මෙම යුගය වන විට මෙම මිථ්‍යාමත ඉතා ජනප්‍රියව මහජනයා අතර පැතිර තිබූ බවයි.[16] නිකාය



සංග්‍රහයට අනුව මෙසේ තෙවරක් ලංකාවට ගෙනා වෛතුලවාදය රජවරුන්ගේ මැදිහත්වීම මත යටපත් වූවද අඹහෙරණ සලමෙවන් රජදවස පූර්ණ නම් වෙළෙඳ පුත්‍රයා විසින් ගෙනෙන ලද ධර්ම ධාතුවෙන් පසුව මේ ධර්මය සාමාන්‍ය ජනයා අතර පැතිරී තිබේ.[17]

මෙම කාලය තුළ ලංකාවට පැමිණි චීන දේශාටක භික්ෂූන්ගේ තොරතුරුවලින් ද මේ පිළිබඳව කරුණු ලබාගත හැකිය. හියුං සාං මහාවිහාරවාසී භික්ෂූන් මහායානය ප්‍රතික්ෂේප කරන ලද බවත් අභයගිරිවාසීන් හීනයාන හා මහායාන දෙකම උගත් බවත් ඔවුන් ත්‍රිපිටකය බොහෝ සෙයින් පැතිර වූ බව ද සඳහන් කරයි. ඉත්සිංගේ කාලයේ සිංහල දීපයේ සියල්ලෝම ආර්ය ස්ථවිර නිකායට අයත් බවත් මහාසාංඝික නිකාය නෙරපන ලද බවත් සඳහන් කර තිබේ.[18] මින් පසුව ශතවර්ෂ තුනක් පමණ යනතුරු වෛතුල්‍ය හෝ අනෙකුත් නිකායයන් පිළිබඳ තොරතුරු වංශකථාවල සඳහන් නොවන අතර එහෙත් ක්‍රි.ව. 840 දී රජ වූ පළමුවැනි වැනි සේන රජ දවස වාජිරියවාදය නම් මිත්‍යා ධර්මය ලංකාවට පැමිණ තිබේ. නිකාය සංග්‍රහයට අනුව රහස් බණ නාමයෙන් හැඳින් වූ එම ධර්මය ගැන රජු පැහැදී ගරු සත්කාර කර තිබේ.[19] ඇතමුන් සඳහන් කරන ආකාරයට මෙය ඉන්දියාවේ පැවති තන්ත්‍රයානයට අයත් වජ්‍රයානික ඉගැන්වීමය. මේ කාලයේ රත්නකූට සූත්‍ර සහ වෙනත් මහායාන ධර්ම ග්‍රන්ථ ලංකාවට ගෙනෙන ලද බව නිකාය සංග්‍රහයේ දැක්වේ[20]. එසේම නීලපට දර්ශනය පිළිපැදි තාන්ත්‍රිකයන් ද ලංකාවේ මෙම වකවානුව වන විට ජනප්‍රියව සිටියේය.[21]

අනතුරුව ක්‍රමයෙන් මෙම නිකායික බලය අඩපන වූයේ මුස්ලිම් ආක්‍රමණිකයන් ඉන්දියාවට පැමිණීමෙන් පසු ඔවුන්ගේ ආක්‍රමණවලට ගොදුරුවීමට භික්ෂූන්ට සිදු වූ බැවිණි. 11 වැනි සියවසේ සොළීන් පලවාහැර ලංකාව එක්සේසත් කළ පළමුවන විජයබාහු රජු ශාසනය බොහෝ සේ පිරිහී තිබෙනු දැක බුරුමයට දූතයන් යවා නැවත උපසම්පදාව ගෙන්වා මෙහි පිහිටුවීය. 12 වන සියවස පමණ වන විටත් විවිධ මතවාද දැරූ

පිරිස් ශාසනය තුළ සිටි බව පෙනෙන්නේ පළමුවැනි පරාක්‍රමබාහු රජුට මිථ්‍යාලබ්ධිකයන් පලවා හැර ශාසනය සංශෝධනය කිරීමට සිදුවීමෙනි. එතුමා දිඹුලාගල මහාකාශ්‍යප හිමියන්ගේ සහයෝගය ඇතිව ධර්මරුචි, සාගලික හා වෛතුල්‍යවාදී යන නිකායත්‍රය එක්තැන්කොට එක් නිකායක් බට පත් කළේය. එසේම දුශ්ශීල භික්ෂූන් ශාසනයෙන් බැහැර කර තිබේ.[22] මෙකී ශාසන ශුද්ධියෙන් පසු වෛතුල්‍යවාද ආදී මත පිළිබඳව ශාසන ඉතිහාසයේ සඳහන් නොවේ.

"...ඉක්බිති නිර්මල වූ සර්වඥ ශාසනය දුෂ්ප්‍රතිපත්තීන් කෙලෙසන ධර්මරුචිය, සාගලිකය, වෛතුල්‍යවාදීය යන නිකායත්‍රය වාසි වූ නොයෙක් සියගණන් දුඃශීල පාපභික්ෂූන් ගෙන්වා ලතා මණ්ඩපයක්හි සන්නිහිත කරවා තුන්යම් රාත්‍රියෙහි සිටිපියෙහි සිට ඔවුන් සැමදෙනම ශාසනාපගත කරවා බුද්ධශාසනය ශුද්ධ කොට තුන් නිකායම සමගි කරවා..."[23]

මේ ආකාරයට මහායාන සම්ප්‍රදායට නැකම් ඇති විවිධ බෞද්ධ සම්ප්‍රදායයන් විසින් වරින් වර පැමිණ ලක්දිව පැවති ථෙරවාද සම්ප්‍රදාය වෙත කරන ලද බලපෑම් දක්වාලිය හැකිය. මහ පැරකුම්බාවන්ගේ ශාසන සංශෝධනයෙන් පසු මහායාන යන නාමයෙන් යුතු කිසිදු සම්ප්‍රදායයක් ගැන සඳහන් නොවූවද ලාංකීය භික්ෂු ජීවිතය කෙරෙහි ඔවුන් විසින් කරන ලද බලපෑම අතිවිශාලය. මුල දී අධ්‍යාත්මික නැඹුරුතාවකින් යුක්ත වූ ථෙරවාද බෞද්ධ භික්ෂූන් ඉන් තරමක් මෑත් වී පොදු ජනතාවගේ ලෞකික අරමුණු ඉටු කිරීම සඳහා හුරුවූයේ මෙකී සම්ප්‍රදායයන්ගේ බලපෑම මතය.

## ලංකාවේ දී සොයාගන්නා ලද මහායානයේ ආභාසය ලද අභිලේඛන

මහායාන සම්ප්‍රදායේ ආභාසය ලැබී ඇතැයි සැලකිය හැකි අභිලේඛන රාශියක් දැනට සොයාගෙන ඇති අතර ඇතැම් ඒවා තුළ සෘජු මහායාන අදහස් දැකගත හැකිය. මේ තුළින්



ඇති වූ බලපෑම අද දක්වාම ලාංකීය සංස්කෘතිය තුළ දැක්නට ලැබේ.

මහායාන අදහස් ඇති ශිලා ලිපි අතරින් දැනට සොයාගෙ තිබෙන පැරණිතම ලිපිය ක්‍රි.ව. අටවැනි සියවසට අයත් මිහින්තලේ අම්බස්තලයේ සේල චෛතිය අසල ගලක කොටා ඇති ලිපියයි. ස්‍රග්ධරා වෘත්තයෙන් බඳින ලද බුද්ධස්තෝත්‍ර මාලාවක් එහි අන්තර්ගතය. භාෂාව සංස්කෘත වන අතර දැනට කියවා ඇති කොටස් අනුව එහි බුදුරදුන්ගේ ත්‍රිකාය සංකල්පයට නමස්කාර කිරීමක් දැකිය හැකිය. ත්‍රිකාය සංකල්පය මහායානයේ ප්‍රධාන ඉගැන්වීමකි.

"නෛකාර ප්‍රවෘත්තං ත්‍රිභව භය හරම් විශ්වරූපෙ රූ පෙතම් වන්දේ නිර්මාණකායම්"[24]

මීට අමතරව මිහින්තලයේ ඉදකටු සෑයේ තිබී සංස්කෘතයෙන් රචනා වූ තඹ තහඩු කිහිපයක් හමු වී තිබේ. එසේම අනුරාධපුරයේ විජයාරාම විහාරයේ ස්ථූපයක තිබී තාරාදේවි, අවලෝකිතේශ්වර හා අකාශගර්භ යන බෝසත්වරුන්ට ද ශිඛින් හා ගගන බුද්ධ යන බුදුවරුන්ටද යැදීම් වශයෙන් ලියූ ස්තෝත්‍ර ඇතුළත් තඹ තහඩු ලැබී තිබේ. මේ පිළිබඳව පරණවිතාන මහතා පවසන්නේ ආරම්භයේ දී බුදුරදුන්ගේ ශාරීරික ධාතූන් කෙරෙහි දක්වන ලද සැලකිල්ල උන්වහනසේගේ ධර්මය ලියූ තහඩු වලටද දැක්වීමේ ආභාසය අපට ලැබුනේ මහායානිකයන්ගේ ත්‍රිකාය සංකල්පය හරහා වන්නට ඇති බවයි.[25]

අනුරාධපුරයට නැගෙනහිරින් වර්තමාන පුලියන්කුලම නමින් පුරාණ පුබ්බාරාම විහාරයේ තිබී ශිලා ලේඛන ලියවුණු ගෙවී ගිය ගල්ලෑලි දෙකක් හමු වී ඇත. මෙහි ධම්මධාතුව හා සම්බන්ධ ක්‍රියා පිළිවෙතක් පිළිබඳව සඳහන් වේ. පරණවිතාන මහතා විශ්වාස කරන පරිදි එහි සඳහන් ආකාරයට පුද්ගලයෙකුට පැවරී තිබුණ කාර්ය වන්නට ඇත්තේ දිනපතා ධම්මධාතුව සජ්ඣායනා කිරීමයි.[26] සිලාකාල රජ දවස ධම්මධාතුව නමින්

යුතු මහායාන ග්‍රන්ථයක් විශේෂ පුදසත්කාර සහිතව ආරක්ෂා කළ බව කලින් ද සඳහන් වුණි. තවද ධම්මධාතුව නම් ග්‍රන්ථයක් පිළිබඳව 10 වැනි සියවසේද සඳහන්වේ. අනුරාධපුරයෙන් ලැබුණු තඹ තහඩු ලේඛනයක **දහම්දා දෙපතෙක්** යනුවෙන් සිංහලෙන් සඳහන් වේ.[27] එහි අර්ථය ධම්මධාතුවෙන් පත් ඉරු දෙකක් යන්නය. මෙහි විශේෂත්වයක් වන්නේ ''දෙපතෙක්'' යන්න සිංහල සහ නාගරී අකුරුවලින් දෙවරක් ලියා තිබීමයි. මෙයින් පැහැදිලිවන්නේ නාගරී අකුරු වල ගුප්ත බලයක් ඇතැයි පැවති විශ්වාසයයි. අද ද ලාංකීය ගැමියන් තුළ මෙම විශ්වාසය පවතී.

අභයගිරි දාගැබෙහි තිබී ලැබුණු තඹ තහඩුවක වට්ටක ජාතකයේ එන පාලි ගාථාවක් නාගරී අකුරෙන් ලිය වී ඇත. මෙයිනිදු මහායානික බලපෑම කෙතරම් ද යන්න සිතාගත හැකිය.[28] තව ද සංස්කෘත නාගරී අකුරෙන් ලියවුණු සෙල්ලිපි දෙකක් සොයාගෙන ඇති අතර නාගරී ලියවිලි සහිත පිදේනි ලෙස සැදූ මැටි තහඩු ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් ලැබී තිබේ. සමහර ඒවායේ තාන්ත්‍රික මන්ත්‍ර දකගත හැකිය.[29] මේවායෙන් පැහැදිලි වන්නේ මහායානික හා තාන්ත්‍රික වත් පිළිවෙත් සාමාන්‍ය ජනයා අතර ජනප්‍රියව පැවැති බවයි.

## ලක්දිව බෝධිසත්ත්ව සංකල්පය ව්‍යාප්තවීම

මහායානික ඉගැන්වීම් අතර බෝධිසත්ත්ව සංකල්පයට ලැබෙන්නේ සුවිශේෂී ස්ථානයකි. ථෙරවාද ඉගැන්වීම් අනුව ප්‍රමුඛත්වය ලැබෙන්නේ බුදු, පසේබුදු හා මහරහත් යන තුන්තරා බෝධියටය. බෝධිසත්ත්වයන් ගැන කියවෙන්නේ ඉන් අනතුරුවය. එහෙත් මහායානයේ බෝසත්වරු දෙවැනි වන්නේ බුදුන්ට පමණි. ලක්දිව මහායාන අදහස් පැතිරයාමෙන් අනතුරුව බෝධිසත්ත්ව සංකල්පය ද පැතිර ගියේය. ථෙරවාද භික්ෂූන් පවා බෝධිසත්ත්ව වන්දනාවට පෙළඹුණ අතර සමහර භික්ෂූන් වහන්සේලා බෝධිසත්ත්ව අවතාර සේ සැලකුනි. එසේම බෝසත් සංකල්පය විෂය කොට ගෙන සාහිත්‍ය කෘති රාශියක් ද ලියැවී ඇත. බුදුවරුන් පවා බෝධිසත්ත්වවරු වන්දනා කළ බව සුමේධ තාපස කතාවෙන් ඉස්මතු කළ අතර බුද්ධවංශ, චරියා



පිටක වැනි ත්‍රිපිටක පොත් තුළට ද මෙම අදහස ඇතුළත් වීමට තරම් මෙය ජනතාව අතර ජනප්‍රිය විය. එසේම සිරිසඟබෝ රජතුමා (ක්‍රි.ව.4) බෝධිසත්ත්වවරයෙක් වශයෙන් සැලකූ අතර ඇතැම් රජවරු බුදු බව පැතූහ. සමහරු තම නමේ විශේෂණයක් ලෙස මෙය යොදා ගත් බව බෝසත් විජයබා, බෝසත් පැරකුම්බා යන නම්වලින් පැහැදිලි වේ. පාලි අටුවා රචනා කළ බුදුගොස් හිමියන් පවා මතුබුදුවන මෛත්‍රී බෝධිසත්ත්වයන් මෙන් මහාවිහාරිකයන් සැලකූ බව මහාවංශයේ දැක්වේ.[30] එසේම බොහෝ දෙනා මහායානිකයන් මෙන්ම බුද්ධත්වය ප්‍රාර්ථනා කළ බව වෙස්සගිරි, අභයගිරි වැනි ස්ථානවලින් සොයා ගන්නා ලද ශිලා ලේඛනවලින් පැහැදිලි වේ. ක්‍රි.ව. 12 වන සියවසේ මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමි විසින් පූජාවලිය ලියන ලද්දේ දෙවන පැරකුම්බා රජ ලවා බුද්ධත්වය ප්‍රාර්ථනා කරවීමටය. කාව්‍යශේඛරය, බුදුගුණ අලංකාරය වැනි කෘති තුළින් ද බුද්ධත්වය ප්‍රාර්ථනා කර ඇත.[31]

මෙලෙස බෝධිසත්ත්ව සංකල්පය වර්ධනය වන අතර බෝධිසත්ත්ව ප්‍රතිමා නිර්මාණය කිරීමද සිදුවිණි. ක්‍රි.ව. 08 වන සියවසට අයත් ලෝහයෙන් තනා ඇති අවලෝකිතේෂ්වර හා කුවේර යන බෝසත් ප්‍රතිමා දෙකක් පිළිබඳව ආනන්ද කුමාරස්වාමි මහතා දක්වා ඇත. වැලිගම කුෂ්ටරාජ ගල නමින් හඳුන්වන ස්ථානයේ බෝසත් ප්‍රතිමාවක් ඇත. මෙහි උෂ්ණීෂයේ අමිතාභ බුදුන්ගේ රූපයෙන් හා අතෙහි වූ නෙළුම් මලින් අවලෝකිතේෂ්වර නම් මහායාන බෝධිසත්ත්වයන්ගේ යැයි හඳුනාගෙන ඇත. ජනප්‍රවාදයකට අනුව කුෂ්ඨ රෝගයකින් පෙළුණු විදේශීය රජෙක් සිය රටින් පැමිණ වැලිගමට ගොඩ බැස මෙම ප්‍රදේශයේ වෛද්‍යවරයෙකුගේ අතින් සුවය ලැබූ බවද මෙය ඔහුගේ ප්‍රතිමාවක් යැයි ද දැක්වේ.[32] මහායාන මතයට අනුව සිංහනාදලෝකේෂ්වර නම් අවලෝකිතේෂ්වරගේ සියලු රෝග සුවකිරීමේ හැකියාවක් ඇති අවතාරයක් ඇති බවද විශේෂයෙන් කුෂ්ටරෝග සුව කිරිමට එතුමා සමත් බවට ද පිළිගනී. එම නිසා මෙය එකී බෝධිසත්ත්ව අවතාරය බව ද කුෂ්ටරාජ ගල නමින් හඳුන්වන්නේ එනිසා බව ද ඇතැම් අයගේ අදහසයි.[33]

ලංකාවේ දක්නට ලැබෙන විශිෂ්ඨතම මහායාන ප්‍රතිමා ලෙස සැළකෙන්නේ වැල්ලවාය බුදුරුවගල පිහිටා ඇති ප්‍රතිමාය. එහි ප්‍රධාන බුද්ධ රූපය දෙපස අවලෝකිතේෂ්වර හා මෛත්‍රි බෝධිසත්ත්ව රූප දැකගත හැකිය. හිස් පළදනාවේ ඇති ධ්‍යානි බුද්ධ රූපයෙන් අවලෝකිතේෂ්වර හඳුනාගත හැකිය. එසේම එක් පසෙක ඔහුගේ භාර්යාව වන තාරා දෙවඟන ද සුධන කුමාරයා ද කැටයම් කර ඇත. ප්‍රතිමා කලාවේ දී අවලෝකිතේෂ්වර පිරිවර කොට මෙහි අනෙක් ප්‍රතිමාද යෙදීම සිරිතකි. ඉතා උසස් කලාත්මක ලක්ෂණ මෙහි ගැබ් වී ඇති අතර, ක්‍රි. ව. 9 වන සියවසේ පොළොන්නරු යුගයට අයත් සේ සැළකේ.[34] ඇතැම් ලාංකීය මහායාන ප්‍රතිමා පිළිබඳ තොරතුරු උතුරු ඉන්දියාවේ බෞද්ධයන් අතර ද ප්‍රචලිතව පැවති බව සඳහන් වේ.[35]

අද ද ලාංකිකයා අවලෝකිතේශ්වරට වැඳුම් පිදුම් කරයි. නමුත් අද ඔහු හඳුන්වන්නේ නාථ යන නාමයෙනි. නමුත් සමහරු නාථ යනු මෛත්‍රී බෝසතුන්ට කියන නමක් ලෙස සලකති. එහෙත් සෙල්ලිපි හා සාහිත්‍යය මූලාශ්‍රයවලට අනුව මෙය එක් අයෙකු නොව දෙදෙනෙකු බව පැහැදිලි වේ. ලංකාතිලක සෙල්ලිපියේ "මෛත්‍රී බෝධිසත්ත්වයන් වහන්සේත් ලෝකේෂ්වර නාථයන් වහන්සේත්" මෑත කාලීන අස්ගිරි විහාර ලේඛනයේ "මෛත්‍රි නාථ, ලෝකේෂ්වර නාථ" රූප දෙකකුත් යනුවෙන් සඳහන් වීමෙන් එය තහවුරු වේ. මෙම බෝධිසත්ත්වයන් පිළිබඳව විශේෂ අවධානයක් කෝට්ටේ යුගයේ දී සිදු වූ බව එම යුගයේ රචිත කෘති රාශියක් එතුමාගේ ආශිර්වාදය ඉල්වා හෝ එතුමා වර්ණනා කර තිබීමෙන් පැහැදිලි වේ.[36] කෝට්ටේ සවැනි පැරකුම්බා රජු සිය මව සිහිවීම සඳහා පැපිලියානේ තැනවූ විහාරයේ මෙම බෝධිසත්ත්වයන්ට දිනපතා මුළුතැන් අඩුක්කු සහ පූජෝපහාර දැක් වූ බව එහි පිහිටුවා ඇති ශිලා ලේඛනයෙන් පෙනේ. V වැනි බුවනෙකබා කාලයට අයත් ලිපියක ද සෙංකඩගල නුවර නාථ දෙවියාට නොකඩවා බත් පිදීම සඳහා කළ දීමනාවක් ගැන දැක්වේ.[37]



අද ලංකාවේ අවලෝකිතේශ්වර හෙවත් නාථ වෙනුවෙන් වෙන් කරන ලද දේවාල අතර මහනුවර දළදා මාළිගාව අසළ ඇති නාථ දේවාලය ප්‍රධානත්වයක් ගනී. මහනුවර වාර්ෂික දළදා පෙරහැරේ දී දළදා වන්සේගේ පෙරහැරෙන් පසු ප්‍රධානත්වය ලැබෙන්නේ නාථ දෙවිඳුන්ටය. මහනුවර සිංහල රජවරු රාජප්‍රාප්තියේ දී නමක් තේරීම හා කඩුව පැළඳීම යන චාරිත්‍ර සිදු කර ඇත්තේ මෙම නාථ දේවාලයේය. අලුත් අවුරුදු උත්සව සමයේ නාථ දේවාලයේ දී රාජකීය වෛද්‍යවරු විසින් බෙහෙත් පැලැටියුෂ යෙදූ කලස් දහසක් සකසා එය විහාරවලට යැවීමේ චාරිත්‍රයක් පැවතී තිබේ. නාථ දෙවියන්ගේ රෝග සුවකිරීමේ හැකියාව ඉන් පිළිබිඹු වේ. ලංකාවේ ප්‍රතිමා ශිල්පීන් භාවිත කරන ප්‍රතිමා කලාව ගැන ලියවී ඇති සංස්කෘත ශාරිපුත්‍ර නම් ග්‍රන්ථයේ නාථ දෙවියන්ගේ රූපාකාර අටක් ගැන කියවේ.[38] මෙයින් පැහැදිලි වන්නේ නාථ දෙවියන් පිළිබඳව අදහස ලාංකිකයන් අතර කොතරම් තදින් මුල්බැස තිබුණේ ද යන්නය. එල්. ද. වලේ පූසාං හේස්ටිංස් විසින් 'Encyclopedia of Religion & Ethics' යන විශ්වකෝෂයට බෝධි සත්ත්වයන් ගැන ලිපියක් ලියමින් අවලෝකිතේශ්වර බෞද්ධයන්ගේ විෂ්ණු යැයි දක්වා ඇත. අවලෝකිත බෞද්ධයන්ගේ ශිවය, තපසෙකි, යකැදුරෙකි යි තවදුරටත් පවසා ඇත.[39] ලාංකියන්ට කෙතරම් මෙම නාථ දෙවියන් සමීපව සිටියේ ද යන්න එයින් ගම්‍ය වේ.

මීට අමතරව ලංකාවේ සතරවරම් දෙවිවරු අතර සිටින සුමනසමන් මහායානික සමන්ත භද්‍ර නම් බෝසතුන් ලෙස ද උපුල් වන් යනුවෙන් හැඳින්වෙන්නේ අවලෝකිතේෂ්වරම බවද ලැබී තිබෙන සාධක වලින් තහවුරු වේ.[40] මෙම දෙවිවරු දෙදෙනා අදත් ලාංකීය බෞද්ධයා අතර ඉතා ජනප්‍රියය.

### ලාංකීය සාහිත්‍ය කෙරෙහි මහයාන බලපෑම

අන් කවර අංශයකටත් වඩා මහායාන ආභාසය ලැබුනේ ලාංකීය සාහිත්‍ය කෙරෙහි යැයි කිවහොත් නිවැරදිය. සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ආදීතම යුගය වශයෙන් සැළකෙන

අනුරාධපුර යුගයේ ලියැවුණු සීගිරි කුරුටුගීවල පවා මෙකී බලපෑම දැකගත හැකිය. ලාංකීය සාහිත්‍ය වඩාත් දියුණුවූයේ සංස්කෘත සාහිත්‍යයේ ආභාසය ලැබීම තුළිනි. සංස්කෘත භාෂාව මහායානිකයන්ගේ ආගමික භාෂාවයි. මහායාන ධර්මය මෙරට පැතිරයාමත් සමගම සංස්කෘත භාෂාව ද ලක්දිව බෙහෙවින් ප්‍රචලිත විය. දැනට ශේෂව පවතින සිංහල සාහිත්‍යයේ මුල්ම ග්‍රන්ථ අතර සියබස්ලකර නම් සිංහල අලංකාර ග්‍රන්ථය රචනාවූයේ සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලද දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය අනුකරණය කිරීමෙනි. ලංකාවේ හමුවී ඇති සංස්කෘත ලිපි සියල්ලම මහායාන අදහස්වලින් යුක්තය. මිහින්තලේ රාජගිරි ලෙණේ තිබී හමු වූ ලිපියක පාලි ධර්ම පාඨ සංස්කෘතයට නගා ඇති අයුරු දැකගත හැකිය (යේ ධර්මා හේතුප්‍රභවා). සියබස්ලකරේ ආගම විරෝධි දෝෂයට උදාහරණ වශයෙන් දක්වා ඇත්තේ සර්වාස්තිවාදීන්ගේ ක්‍ෂණිකත්වය ගැන දක්වා ඇති කාව්‍යාදර්ශයේ ශ්ලෝකයක් පරිවර්ථනය කිරීමෙනි.

"සත්‍ය මේවාහ සුගතඃ - සංස්කාරා න විනශ්වරාන්
තථාහි සා චකොරති - සථිතෛවාද්‍යපි මේ හෘදි"[41]
(කාව්‍යාදර්ශය 176)
"මුනිවරු සවිකර - නො නසි වී සබා වී
එසෙම නොහෝ සියරු නෙත් -පවති අදද ළෙහි මා"

මහ පැරකුම් රජ දවස විසූ දිඹුලාගල කාශ්‍යප හිමි බාලාවබෝධන නම් සංස්කෘත ව්‍යාකරණය රචනාකළේ චන්‍ද්‍රගෝමීන්ගේ චාන්‍ද්‍රය වියරණය අනුවය. මහා ශාබ්දික මුගලන් හිමියන්ගේ මොග්ගල්ලාන වියරණය ද සිදත් සඟරාව ද රචනා වූයේ චාන්‍ද්‍රය වියරණය අනුවය.[42] දොළොස්වන සියවසේ විසූ ගුරුළුගෝමීන් විසින් ධර්මප්‍රදීපිකාව රචනා කිරීම සඳහා සංස්කෘත මහායාන කෘති රාශියක් පරිශීලනය කර ඇත. ඒ අතර ශාන්තිදේවගේ බෝධිචර්යාවතාරය, ධර්මකීර්තිපාදයන්ගේ ප්‍රමාණවාර්තිකය හා ආර්යශූර පාදයන්ගේ ජාතකමාලාව ප්‍රධානය. අමාවතුර රචනා කිරීම සඳහා ද මෙම කෘතිවල ආභාසය ලබාගත් බව පෙනේ.[43] මහායාන ආභාසය නිසා බෝධිසත්ත්ව සංකල්පය පැතිරුණු අයරු කලින් සඳහන් කරන



ලදි. සාහිත්‍යකරණයට ද මෙය ප්‍රවේශ වෙමින් ජාතක කථා ආශ්‍රය කරගෙන කාව්‍ය ග්‍රන්ථ රාශියක් රචනා විය. කව්සිළුමිණ, මුවදෙව්දාවත, සසඳාවත, කාව්‍යශේඛරය, ගුත්තිලය වැනි කාව්‍ය ඒ අතර ප්‍රමුඛය. ජාතක පොත ද ඉමහත් ජනාදරයට පාත්‍ර වූ ග්‍රන්ථයකි. මේ කෘති රචනා කිරීම සඳහා සංස්කෘත ග්‍රන්ථවල ආභාසය ලබාගත් බව දැකගත හැකිය. ව්‍යාඝ්‍රී ජාතකය ථෙරවාද ජාතක පොතේ දක්නට නැත. එහෙත් සසදාවතේ දී ජාතකමාලාවේ ඇති එම ජාතකයෙන් පද්‍ය උපුටා ගත්හ. එය ආර්යසූරගේ ජාතක මාලාවේ ප්‍රථම කතාවය. එම කථාව ස්වර්ණ ප්‍රභාෂ, අවදාන කල්පලතා යන කෘති තුළ ද ධර්මකීර්ති හිමියන්ගේ සද්ධර්මාලංකාරයේ ද දැකගත හැකිය. ජාතකමාලාවේ හස්ති ජාතකයෙන් ද කරුණු උපුටාගෙන ඇත. ටීකාචාර්ය සාරිපුත්‍ර හිමියන් විසින් රචිත අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය සඳහා නාගබෝධි හිමිගේ ආර්යසත්තාවතාරයේ ආභාසය ලබාගෙන ඇත. දෙවැනි පැරකුම්බා රජු විශුද්ධිමාර්ග සන්නය සඳහා මහායාන ග්‍රන්ථ බෙහෙවින් ඇසුරු කරගෙන තිබේ.[44]

ථෙරවාද භික්ෂූන්ට වෛද්‍ය ශාස්ත්‍ර ආදී කටයුතු තහනම්ය. එහෙත් මහායානිකයන්ට තර්ක න්‍යාය, වෛද්‍ය, ජ්‍යෝතිෂය ආදිය ඉගෙන ගත යුතුය. පූජාවලී කතෘ මයුරපාද හිමියන් ථෙරවාද වූවත් වෛද්‍ය ශාස්ත්‍රීය කෘති කිහිපයක්ම රචනා කර තිබේ. එම හිමියන් විසින් දේවපතිරාජ ඇමතියාගේ ආරාධනාවෙන් දෙවැනි පැරකුම්බා රජු ලවා බුදුබව ප්‍රාර්ථනා කරවීම සඳහා පූජාවලී නම් ග්‍රන්ථය රචනා කරන ලද බව ඉහත ද සඳහන් කරන ලදි. පාලි හා සිංහල යන භාෂා දෙකෙන්ම රචනා වී ඇති හත්ථවනගල්ල විහාරවංශයේ ආර්ය සූරගේ ජාතකමාලාවෙන් උපුටා ගත් පද්‍ය විස්සක් පමණ ඇත.[45] තොටගමුවේ රාහුල හිමියන් විසින් රචනා කරන ලද පඤ්චිකාප්‍රදීපයේ දී වසුබන්ධුගේ අභිධම්කෝෂයෙන් හා රත්න මතී පාද, රත්න ශ්‍රී ඥාන ආදී මහායාන පඬිවරුන්ගේ කෘති තුළින් ද උපුටා ගැනීම් කර ඇති බව දැකගත හැකිය. කාව්‍යශේඛරයේ අවසාන පද්‍යයෙන් රාහුල හිමියන් 'මම ද බුදු වෙම්වා ලොව්තුරා' යනුවෙන් බුද්ධත්වය ප්‍රාර්ථනා කර තිබෙනු

දැකගත හැකිය.[46] කෝට්ටේ යුගයේ රචනා කරන ලද ගිරා, කෝකිල, පරවි, වැනි සංදේශ කාව්‍යවල ඉතා උසස් ලෙස නාථ දෙවියන් වර්ණනා කර තිබේ. නාථ යනු මහායාන අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් බව පෙරද සඳහන් කළේය. ධර්මකීර්ති හිමිගේ සද්ධර්මාලංකාරය ද, ධම්මදින්න හිමියන්ගේ සද්ධර්මරත්නාකරය ද පිළිවෙළින් දිව්‍යාවදානය, භාණගේ හර්ෂ චරිතය හා නාගර්ජුනගේ ශූන්‍යතාවාදය වැනි කෘති වල ආභාසයෙන් රචනා කර ඇත.

මිළින්ද පඤ්හය මුල දී මිළින්ද පරිපෘච්ඡා නම් සංස්කෘත පොතේ පරිවර්ථනයක් ලෙස සැලකේ. එහි භාෂාව පාලි භාෂා රීතියට එකඟ නැත. එහෙත් මෙම පොතෙන් අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් පවා කරුණු උපුටාගෙන ඇත.[47] මහායානිකයන් මෙන් බුදුරදුන්ගේ අතිමානුෂීයත්වයක් විස්තර කරමින් නාමාෂ්ට ශතකය රචනා කර තිබේ. එහි අමිතාභ බෝධිසත්ව නම ද ඇත. අලගියවැන්න මුකවැටිතුමාගේ දහම්සොඬ කාව්‍යට මුල් වූ දහම්සොඬ ජාතකය ජාතක පොතේ නොමැත. එහෙත් ජාතක මාලාවේ එය ඇත. එසේම වේදේහ හිමිගේ රසවාහිනිය, ඒ අනුව ලියූ සද්ධර්මාලංකාරයේ ද ලොකෝපකාරයේ ද මේ කථාව දැගත හැකිය. අලගියවැන්නගේ සුභාෂිතයේ ද ශාන්තිදේවයන්ගේ බෝධිචර්යාවතාරයේ පරිවර්ථන දැකගත හැකිය.[48] පාලි ඛුද්දක නිකායේ ග්‍රන්ථයක් වන චරියාපිටකය නම් ග්‍රන්ථය ජාතක මාලාව ආශ්‍රයෙන් සැකසූවක් බවට ද පිළිගනී.[49] එසේම මහායානයේ පිළිගන්නේ දාන, ශීල, ක්‍ෂාන්ති, වීර්ය, ධ්‍යාන, ප්‍රඥා යන පාරමිතා සයකි. චරියාපිටකයේ මතාන්තරයක් ලෙස මෙම පාරමිතා සය ගැන දැක්වේ.

ථෙරවාද ත්‍රිපිටකයේ බුදුරදුන්ගේ ලංකා ගමන පිළිබඳ කිසිදු තැනක සටහන් වී නොමැත. එහෙත් මහායාන ලංකාවතාර සූත්‍රයේ දී බුදුරදුන් රාවණා රජුගේ ආරාධනාවෙන් සමන්තකූට පර්වතයේ දී මෙය දේශනාකළ බැව් දැක්වේ. මෙම සූත්‍රය ක්‍රි.ව. 04 වන සියවස වන විට බොහෝ රටවල ප්‍රචලිතව පැවතුනේය. බුදුරදුන්ගේ ලංකාගමනය ගැන පාලි අටුවාවල හා වංශකතාවල



සඳහන් වන්නේ ක්‍රි.ව. 05 වන සියවසෙන් පසුවය. එම නිසා ලංකාවතාර සූත්‍රයේ ආලෝකය මෙම ප්‍රවෘත්තිය ඇතිවීමට බලපාන්නට ඇත.[50]

## ආගමික පුද පූජා හා එදිනෙදා ජීවිතය කෙරෙහි මහායානික බලපෑම

අප අද වැඩි අවධානයක් නොදැක්වූව ද ථෙරවාදයට එතරම් සමීප නැති මහායානයෙන් උකහාගත් සිරිත් විරිත් හා පූජා චාරිත්‍ර විශාල ප්‍රමාණයක් අප සතුව ඇත. මහායානිකයන් භක්ති වාදයට මුල් තැනක් දීම නිසා සාමාන්‍ය ජනයා ද මෙය පහසුවෙන් උකහාගත්හ. දළදා වහනසේ ලක්දිවට රැගෙන ඒමෙන් පසුව මහාවිහාරිකයන් එය කෙරෙහි ගෞරව දැක්වීමට උත්සාහ නොකළ අතර අභයගිරිකයෝ එය තබාගෙන වත් පිළිවෙත් ආදිය ඉටු කළහ. පසු කාලයේ එය ලක් රාජ්‍යයේ සංකේතය වශයෙන් ද සැලකුණු අතර දළදා වහන්සේ උදෙසා පුද පූජා හා පෙරහැර පැවැත්වීම ද ආරම්භ විය. ථෙරවාදීන් බොහෝ විට බාහිර පුද පූජා සඳහා උදාසීනය. එහෙත් මහායනිකයෝ ඒවා කෙරෙහි වැඩි සැළකිල්ලක් දැක්වූහ.

ථෙරවාදයේ අන්තරාභවයක් ගැන සඳහන් නොවේ. එහෙත් වසුබන්ධුගේ අභිධර්ම කෝෂයේ දී ගන්ධබ්බයා ගැන කියවේ. ඔහු පුනර්භවයට සූදානම්ව මව් කුසක් සොයමින් සිටින්නෙකි. කෙනෙකු මිය ගිය පසු සත්දිනකින් මව් කුස පිළිසිඳගැනීම මහායාන සංකල්පයක් වන අතර සත්දින දානය ලාංකිකයන් අතර ජනප්‍රිය වූයේ මේ ඔස්සේය. එසේම පුණ්‍යානුමෝදනාව හා සම්බන්ධ තිරෝකුඩ්ඩ සූත්‍රය තන්ත්‍රයානිකයන්ගේ බලපෑම නිසා පසුකාලයේ හටගත්තකි. බුදුරදුන් දවස නොපැවති ජිනපඤ්ජරය, ගිනි පිරිත, ජය පිරිත ආදී සූත්‍ර මහායාන බලපෑම මත බිහි වූ දේශනාවන්ය. කාලත්‍රයවර්තී බුදුවරුන් වන්දනා කිරීම මහායාන සම්ප්‍රදායකි. එහෙත් ලාංකිකයෝ ද ''පච්චුප්පන්නාචයෙ බුද්ධා අහං වන්දාමි සබ්බදා'' යනුවෙන් කාලාත්‍රයේ බුදුවරුන්ට නමස්කාර කරති. ගිනි පිරිතේ භාෂා විලාශය පාලි භාෂාව සමග නොගැළපේ. එය

මහායානිකයන්ගෙන් ගත් ආරක්‍ෂක මන්ත්‍රයකි. මහායානික මහාමයූරී ධාරණීයත් මෝර පිරිතත් එක සමානය. තව ද සිවලී යන්ත්‍රය, රත්න යන්ත්‍රය ආදී යන්ත්‍ර භාවිතය ලාංකිකයන් අතර ජනප්‍රිය වූයේ තාන්ත්‍රිකයන් නිසාය.[51]

තවද අද මිනිසුන් මෙන්ම ලාංකික භික්ෂූන් පවා යන්ත්‍රමන්ත්‍ර ආදී ගුරුකම් මෙන්ම ජ්‍යෝතිෂය කටයුතු ද වෛද්‍ය කටයුතුවල ද නියැලීම සුලභව දැකගත හැකිය. මේවා බොහෝ සෙයින්ම ජනප්‍රිය වූයේ මහායානයේ බලපෑම මතය.

## සමෝධානය

ඓතිහාසික වාර්තාවල සඳහන්වන ආකාරයට ලාංකික භික්‍ෂු සමාජය තුළ පූර්ණ මහායාන ඉගැන්වීම් අනුගමනය කළ පිරිස් සිටි බවට සාධක නොමැත. ඉහත සඳහන් කළ කරුණුවලට අනුව විටින් විට ලංකාවට පැමිණි ථෙරවාද නොවන විවිධ බෞද්ධ සම්ප්‍රදායයන්ගේ බලපෑම් ලැබුණ ද ඒවා ඍජුව මහායානයට සම්බන්ධදැයි ඒකමතිකත්වයක් නැත. අභයගිරිවාසීන් වජ්ජිපුත්තක සම්ප්‍රදායේ ආභාසය ලැබූ බව සඳහන් වූවද ඔවුන් ද ථෙරවාද සම්ප්‍රදායෙන් වෙන්වගිය නිකාය එකොළහෙන් එකකි. වෛතුල්‍යවාදීන්, ධර්මරුචි හා සාගලික යනු භාරතයේ පහළ වූ බෞද්ධ සම්ප්‍රායයන් නොව එකී සම්ප්‍රදායයන්ගේ ආභාසයෙන් මෙරට දී බිහිවූ ඒවා බව පැහැදිලි වන්නේ මුල් නිකායයන් දහ අටට ඒවා ඇතුළත් නොවීමෙනි. හියුං සාං විසින් මහාවිහාරවාසීන් හීනයාන ස්ථවිරවාදීන් වශයෙන් හා අභයගිරිවාසීන් මහායාන ස්ථවිරවාදීන් වශයෙන් නම්කර ඇතත් ඒ සඳහා හේතු දක්වා නොමැත.[52] ඇතැම් තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ මහායානයේ ඍජු අදහස්වලට වඩා මහායානයේ ආභාසය ලැබූ තාන්ත්‍රික අදහස් ලක්දිව ව්‍යාප්තව තිබූ බවයි. කෙසේ වූවද මහින්දාගමනයත් සමග ථෙරවාද බුදුසමයේ බලකොටුවක් වශයෙන් පැවති ලාංකික බුදුසමයට සෙසු බෞද්ධ සම්ප්‍රදායයන්ගේ බලපෑමෙන් මිදී ස්වකීය ස්වාධීනත්වය පවත්වාගෙන යාමට අපහසු විය. නිරන්තරයෙන් භාරතය සමග පැවති සමීප සම්බන්ධතාව නිසා ථෙරවාද බුදුදහම ලැබීම සේම පසුකාලීනව භාරතයේ



සංවර්ධනය වූ මහායාන ආදී අනෙකුත් බෞද්ධ සම්ප්‍රදායයන්ගේ බලපෑමෙන් මිදීමට හැකියාවක් නොලැබීයැයි සිතීම සාධාරණය. සපුරා මහායානය අනුගමනය නොකළ ද එම ඉගැන්වීම් හැදෑරීමට ලාංකික ථෙරවාද භික්‍ෂූන් වහන්සේලා යොමුවන්නට ඇත. විශේෂයෙන් සාම්ප්‍රදායට ගරු කළ මහාවිහාරික භික්ෂූන්ට වඩා වෙනස්වීමට බිය නොවූ අභයගිරිවාසී භික්‍ෂූන් භාරතයේ පැවති අනෙකුත් බෞද්ධ සම්ප්‍රදායයන් සමග සමීප ඇසුරක් පැවැත් වූ අතර ඔවුන්ගේ ඉගැන්වීම්ද හැදෑරිය. එසේම මොවුන් පොදු ජනතාව සමග ගැටෙමින් ජනතාව සමග වඩා සමීපව කටයුතු කළ නිසා ජනතාව අතර ද ඉතාමත් ඉක්මනින් මෙම සංකල්ප පැතිරී ගියේය. වංශ කතාකරුවන් පවසන මහායාන බලපෑම මෙරට තහවුරු වූයේ නූගත් ජනතාව අතර යැයි යන අදහස තහවුරු වන්නේ මේ සමීප සබඳතාව නිසා ය. එහෙත් ථෙරවාදීන් දැනුවත්ව හෝ නොදැනුවත්වම මහායනයේ බලපෑම ථෙරවාද සම්ප්‍රදාය තුළ ද ව්‍යාප්තව ගිය බව ඉහත කරන ලද විශ්ලේෂණයෙන් මනාව පැහැදිලි වේ. එය එක් අංශයකට පමණක් සීමා නොවීය. ථෙරවාද ධර්මය කෙරෙහි ද ලාංකික භාෂාව, සාහිත්‍ය හා රාජ්‍ය සංස්ථාවන් කෙරෙහි ද එම බලය පැවතුනේය. එසේම ජනතාවගේ සිතුම් පැතුම් කෙරෙහි ද මහායානයේ බලපෑම ලැබී තිබෙන බව 'දහසක් බුදුන් බුදුවන පාන්දර' වැනි යෙදුම් අදද ගැමි ජනයාගේ මුවින් පිට වීමෙන් සිතාගත හැකිය. 12 වන සියවසේ මහපැරකුම්බාවන්ගේ ශාසන සංශෝධනයෙන් පසු වසර දහසක් පමණ මෙරට පැවති ථෙරවාද නොවන බෞද්ධ සම්ප්‍රදායයන් නිලවශයෙන් මැකී ගිය ද එම සංකල්ප භික්ෂූන්ගේ මෙන්ම ජනතාවගේ ද සිත් තුළින් ඉවත් කිරීමට අද දක්වාම නොහැකි වී තිබේ. ථෙරවාද ඉගැන්වීම් ලෙස අද අප භාවිත කරන බොහෝ සංකල්ප මහායානික බලපෑම මත ලැබුණු ඒවා බව අද අපට අමතකය. මෙයින් පැහැදිලි වන්නේ මහායාන ඉගැන්වීම් ශ්‍රී ලංකීය සංස්කෘතිය කෙරෙහි කරන ලද බලපෑම සුළුපටු නොවන බවයි.

## ආන්තික සටහන්

1. මහාවංශය (සංස්.) විජේසිංහගේ, රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව, කොළඹ, 1889, පරි.V, ගා. 11
2. -එම- පරි. 14, ගා. 6
3. එකම් හි යානං ද්විතීයං න විද්‍යතේ
   තෘතීයං නෙවාස්ති කදාචි ලොකේ - සද්ධර්ම පුණ්ඩරීකං
4. නිකාය සංග්‍රහය (සංස්.) ජයබාහු ථෙර, මුනිදාස කුමාරතුංග, විද්‍යාදර්ශන ප්‍රකාශන, කොළඹ, 1922, පිටු .09
5. Dutt, Nalinaksha, Spread of Buddhism, Luzac and Co, London, 1925, Pp 181-207
6. නිකාය සංග්‍රහය, 12 පිටුව
7. ම. ව., 36 පරි., 31-33 ගාථා
8. පරණවිතාන, එස්., ලක්දිව මහායාන වාදය, නිවන් මග, අංක 26 (මහායාන කලාපය), බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, පිටුව 60
9. රාහුල හිමි, වල්පොල, ලක්දිව බුදුසමයේ ඉතිහාසය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, කොළඹ 10, 1999, පිටුව 93.
10. සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මහායාන අදහස්, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 1952, 403 පිටුව
11. නිකාය සංග්‍රහය, පිටුව 12
12. -එම-
13. මහාවංශය, පරි. 39, ගා. 46
14. නිකාය සංග්‍රහය, පිටුව 14
15. පරණවිතාන, එස්., ලක්දිව මහායාන වාදය, නිවන් මග (සඟරාව) අංක 26 (මහායාන කලාපය), පිටු 61
16. නිකාය සංග්‍රහය, පිටුව 14, මහාවංශය පරි. 42, ගා. 25
17. නිකාය සංග්‍රහය, පිටුව 15
18. පරණවිතාන, එස්., ලක්දිව මහායාන වාදය, නිවන් මග (සඟරාව) අංක 26 (මහායාන කලාපය), පිටුව 61
19. නිකාය සංග්‍රහය, පිටුව 15
20. -එම- පිටුව 16
21. -එම- පිටුව 16
22. -එම- පිටුව 24
23. -එම- පිටුව 19
24. පරණවිතාන, එස්., ලක්දිව මහායාන වාදය, නිවන් මග (සඟරාව) අංක 26 (මහායාන කලාපය), පිටුව 63
25. -එම- පිටුව 65
26. -එම- පිටුව 66
27. -එම- පිටුව 66
28. -එම-
29. -එම- පිටුව 67
30. මහාවංශය (සංස්) විජේසිංහගේ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ, 1889, පරි. 37, ගා. 243
31. සාසනරතන හිමි, එම්. ලක්දිව මහායාන අදහස්, පිටුව 415



32. පරණවිතාන, එස්., ලක්දිව මහායාන වාදය, නිවන් මග (සඟරාව) අංක 26 (මහායාන කලාපය), පිටුව 68
33. -එම-
34. -එම-
35. -එම-
36. මහත සසර සයුරෙහි කුමුටුවැ සර ණ
    අගත සත නිවන්පුර ගෙන යන අටි ණ
    සතත සොඳුරු බුදු ගුණ කුරු දම් පුර ණ
    දියත පසිඳු නතිඳුන් දැක ගොස් සොබ ණ
    (ගිරා සංදේශය, 221 කවිය )

    සිරි පෑ හිරුනරිඳු තෙද යස දියත පසි ද
    මතුවන බුදු රදු සැරදෙ තොටගමු වෙහෙර නති ද
    (කාව්‍යශේඛරය, සර්ග XV, 24 කවිය )
37. පරණවිතාන එස්., ලක්දිව මහායාන වාදය, නිවන් මග (සඟරාව) අංක 26 (මහායාන කලාපය), පිටුව 71
38. -එම- 74 පිටුව
39. -එම පිටුව 75
40. -එම- පිටුව 76-77
41. කාව්‍යාදර්ශය (සංස්.) සෝරත හිමි, වැලිවිටියේ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000, 176 පිටුව
42. සාසනරතන හිමි, එම්., ලක්දිව මහායාන අදහස්, පිටුව 417
43. -එම- පිටුව 418
44. -එම- පිටු 419-420
45. -එම- පිටුව 420
46. -එම-
47. -එම- පිටුව 422
48. -එම- පිටුව 423
49. -එම-
50. -එම- පිටුව 425
51. -එම- පිටුව 428
52. Dutt, Nalinaksha, Spread of Buddhism, Luzac and Co, London, 1925, pp. 211-212